සති පාසල

7 ශ්‍රේණිය | විද්‍යාව | සැප්තැම්බර් 4වන සතිය

16 - බලය හා චලිතය

01. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්

- ඔබේ විද්‍යාව පෙළ පොතේ (2 කොටස) පිටු අංක 79 හි දැක්වෙන ක්‍රියාකාරකම 16.2 සිදු කරන්න.
- ඔබේ විද්‍යාව පෙළ පොතේ (2 කොටස) පිටු අංක 80,81,82 හි දැක්වෙන ක්‍රියාකාරකම 16.3, 16.4 හා 16.5 කෙරෙහි අවධානය යොමු කරන්න.
- ඔබේ විද්‍යාව පෙළ පොතේ (2 කොටස) 79 - 84 පිටු අංක යටතේ ඇති **බලය** නම් පාඩම හොඳින් අධ්‍යයනය කරමින් බලය, බලයේ ලක්‍ෂණ, බලය මනින උපකරණ බලයේ ඒකක හා බලයක් යෙදීම මගින් සිදු කළ හැකි කාර්ය පිළිබඳව අධ්‍යයනය කරන්න.
- ඔබ උගත් කරුණු ඇසුරෙන් කෙටි සටහනක් සකස් කරන්න.

02. ඉහත ක්‍රියාකාරකම් සඳහා උපයෝගී කර ගත හැකි ආධාරක

- 7 ශ්‍රේණිය විද්‍යාව දෙවන පෙළ පොත (පිටු අංක 79 සිට 84)
- E - නැණ පියස වෙබ් අඩවිය
  https://www.enenapiyasa.lk/lms/course/view.php?id=21#section-16
- E - තක්සලාව වෙබ් අඩවිය
  https://www.e-thaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=986&section=16
- ගුරු ගෙදර නාලිකාව
  https://www.youtube.com/watch?v=b8qH8b2z7u8

03. මෙම සතිය තුළ නියමිත පාඩම්වලින් ලබා ගත යුතු ඉගෙනුම් ඵල

- උදාහරණ දක්වමින් ඇදීමක් හෝ තල්ලුවක් ලෙස බලය විස්තර කිරීම.
- විශාලත්වයක් හා දිශාවක් ඇති රාශියක් ලෙස බලය විස්තර කිරීම.
- බලයේ අන්තර්ජාතික ඒකකය නිව්ටනය බව ප්‍රකාශ කරයි.
- දුර සහ විස්ථාපනය යන සංකල්පවල වෙනස්කම් දැක්වීම සඳහා සරල ක්‍රියාකාරකම් සිදු කිරීම.
- ඇදීමක් හෝ තල්ලුවක් ලෙස බලය ආදර්ශනය කිරීමට ක්‍රියාකාරකම් සැලසුම් කිරීම.
- එදිනෙදා ජීවිතයේ දී බලයේ වැදගත්කම හඳුනා ගැනීම.

04. ඇගයීම

01) පහත සඳහන් ප්‍රකාශන වල හිස්තැන් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය පද වරහන තුලින් තෝරා ගන්න.
(නිවුටන්, බලයක්, නිශ්චල, ඇදීමක්, විශාලත්වයක්)

1. බලයක් යෙදීමෙන් ............................... වස්තුවක් චලනය කළ හැක.
2. බලයකට ............................... හා නිශ්චිත දිශාවක් ඇත.
3. ............................... හෝ තල්ලු කිරීමක් බලයක් යෙදීම ලෙස හැඳින්වේ.
4. ............................... යෙදීමෙන් චලනය වන වස්තුවක වේගය වෙනස් කළ හැක.
5. බලය මනින සම්මත ඒකකය ............................... වේ.